# People's Health Movement Sri Lanka

# NEWS LETTER



## 3rd Quarter Journal 2021

## Advisory Committee

**Menu Nilukshika**
**Nishantha Preethiraj**
**Somaratne Herath**

## Editors

**Indrachapa Ruberu**
**Nivanka Mohotty**
**Minoli De Silva**

## Page Setting & Art Work

**Minoli De Silva**

## Contact

**Sirimal Peiris**
**sirimalp@sltnet.lk**

Please note that the ownership/responsibility belongs to the respective writers of each article.

Your ideas, comments and articles for the future editions are warmly welcomed. Please write to us, to the following email address, sirimalp@sltnet.lk

## වර්ථමානය වන විට රටේ තීරනාත්මක ශ්‍රම බලකාය වන මෙම ශ්‍රමිකයින්ගේ ජීවිත ධනපති වහල් වෙළඳුන්ට භාරදීම සම්පූර්ණ වශයෙන් ආන්ඩුවේ අසමත්භාවය ප්‍රදර්ශනය වීමක් .එමෙන්ම ඔවුන් මත දිගහැරෙන හිංසනය තුවුර කිරීමක්,,

මේ වන විට ප්‍රධාන අපනයන සැකසුම් කළාප තුලින් ආරම්භ වූ,කෝවිඩ් ව්‍යාප්තිය ලංකාව පුරාම ඇති, ඇඟළුම් ආයතන දක්වා ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇත. මේ වන විට කටුනායක , බියගම , කොග්ගල ආදී ප්‍රධාන නිදහස් වෙළද කලාප ඇතුළු අපනයන සැකසුම් කලාප වල පිහිටි ඇඟළුම් ආයතන වල තම සේවක ප්‍රමාණයෙන් 80 ටත් අධික ප්‍රමානයක් ආසාධිතයින් බවට පත්වීම තුළ, වසා දමා ඇත. බියගම එක් ආයතනයක් දිගින් දිගටම ආසාධිත සේවකයින් බලහත්කාරයෙන් නිෂ්පාදන කටයුතු වල යෙදවීම නිසා ආයතනයට විරුද්ධව නඩු පවරා ඇත. මේ වන විට ඇඟළුම් ආයතන කිහිපයක සේවකයින් මියගොස් ඇති අතර එහි වර්ධනයක්ද පැහැදිලිව පෙනෙන්නට ඇත. ඇතැම් ආයතන ඉදිරිපිට එම සේවකයින්ගේ පවුල් වල සාමාජිකයින් ආසාධිත තම පවුලේ අයගෙන් බලහත්කාරයෙන් වැඩ ගැනීමට විරුද්ධව ආයතනය ඉදිරිපිට උපවාස කිරීම ආරම්භ කිරීම දක්වා මෙම ප්‍රශ්නය බරලතල වී ඇත. ආයතන පාළකයින් විසින් ඡගඣගඎ පරීක්ෂන සිදු කිරීම, නිෂ්පාදනයන්ට හානී නොවන ආකාරයට ඉතා සුළු වශයෙන් සිදු කිරීමට පටන් ගෙන ඇත. එන්නත්කරණය ඉතා මන්දගාමී ලෙස ක්‍රියාත්මක වන අතර මෙම ඇඟළුම් සේවකයින්ට එම එන්නත්වල හිමිකම නැතිවන තත්වයක් නිර්මානය වී ඇත.

එමෙන්ම නිරොධායනයට ලක් වන සේවකයින්ගේ පඩිපත කපාහරින අතර, වැඩ කරන ආයතන වලින් නිරෝධානය කාළසීමාව තුල ඔවුන්ට කිසිම ආධාරයක්ද ලබා නොදෙයි. එමෙන්ම ආසාධිත සේවකයන් ඔවුන් ලැගුම්ගෙන සිටින නේවාසිකාගාරවලම නිරෝධායනය කර ඇති අතර ඔවුන්ටද ප්‍රමානවත් ලෙස ආහාර ටිකවත් ලබා දීමට ආයතනයෙන් හෝ කිසිදු වගකිවහුතු පාර්ෂවයක් කටයුතු නොකරයි. එමෙන්ම නේවාසිකාගාරවල ඇති පොදු පහසුකම් ඉතා අවම මට්ටමක පවතින අතර , මේ තුල රෝග ව්‍යාප්තිය ඉතා සීඝ්‍රලෙස සිදු වෙමින් පවතී. ඉතා අවසනාවන්ත හා බරපතපම ප්‍රශ්නය වනුයේ ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව පිලිබඳ වගකීමෙන් රජය හා පාළකයින් ඉවත් වී සිටීමයි.

පසුගිය මැයි මස 21 වන දින පැවති, කාර්‍යසාධක බළකා රැස්වීමකදී ජනාධිපතිවරයා විසින් පාළකයින්ට දනුම් දී ඇත්තේ තම තමන්ගේ ආයතනයේ සේවතයින්ගේ ඡගඣගඎ සිදු කිරීම , එන්නත්කරණය, හා යම් සේවකයෙක් ආසාධිත තත්වයට පත් වුව හොත් ඔවුන් රැකබලා ගැනීමේ වගකීම ආයතන හිමියන් බාරගත යුතු බවයි. එමෙන්ම කිසිදු ආයතනයක් වසා නොදමීමට වග බලා ගන්නා ලෙස ද දනුම් දී ඇත. මෙහිදී පාළක පන්තිය , ඔවුන්ට ඒ සඳහා මුදල් වැය කිරීමට නොහැකි බවත් , එම වගකීම භාර ගත නොහැකි බවත් , දන්වා ඇති නමුත් ඊට විසඳුම් එම සභාව තුල සාකච්චා වී නොමැත.

මේ අනුව සේවකයින්ගේ වගකීම , ආරක්ෂාව පිලිබද ප්‍රශ්නය එකිනෙකාට පාස් කරමින් තිබෙන තත්වයක් නිර්මාණය වීමතුල සේවකයින්ගේ ජීවිතාරක්ෂාව බරලතල ලෙස අවධානම් සහගත තත්වයකට පත්ව ඇත. මෙම තත්වයතුළ පාළකයින් ආයතන අඛන්ඩව පවත්වාගෙන යාමටද කටයුතු කරන අතර ඒ තුළ විය හැකි හානියද අවම කර ගනිමින් ලාභය උපරිම කර ගැනීමටද කටයුතු කරමිනු සිටී . එයට හොදම සාක්ෂිය මේ වන විට මහබැංකු වාර්තා පෙන්නුම් කර සිටින පරිදි පසු ගිය කාළ සීමාව තුළ අපනයනය 185 කින් වැඩි වර්ධනය වී තිබීමයි. මෙයට පිලයම් ලෙස පාළක පන්තිය ලාභය හා වඩා වාසිසහගතව කටයුතු කලයුතු ආකාරයන් පිලිබඳ භාවිතාවන් මේ වන විට ක්‍රියාවට නංවා ඇත. මුලින්ම ඔවුන් ඡගඣගඎ පරීක්ෂන ඉතා අවම කිරීමට වගබලාගෙන ඇත. මන්ද එක් අතකින් ඡගඣගඎ සදහා වැය වන මුදල අවම කර ගැනීමට හා වාර්ථාවන ආසාධිත සේවක ප්‍රමාණය අවම නොකලහොත් ආයතනය පවත්වාගෙන යාමට හා නිෂ්පාදනයට බාධාවක් වන බැවිනි. ගැබිනි මව් වරුන්ටද මාස 7 ක් ගතවන තුරු සේවයට වාර්ථා කිරීමටද සිදුවී ඇත.

එන්නත්කරණයද ලබා දෙනුයේ වයස 30 ට වැඩි සේවකයින්ට වන අතර එයිනුත් එක් ආයතනයකින් 30 ක් හෝ 40 ක වැනි සේවක ප්‍රමාණයකටය. අනික් අතින් සේවකයින්ට මෙම ජගක්‍ගසෘ සිදු කිරීම පිළිබඳ ආයතන විසින් ගෙන යන වැඩපිළිවෙල සේවකයින් විසින් අනුමත කරමින් සිටී. මන්ද ජගක්‍ගසෘ පරීක්ෂන සිදු කර සේවය ලබා ගැනීම නතර කළහොත් එය තමන්ගේ මාසික වැටුප නැති වන ත්තවයකට ගමන් කරන අතර නේවාසිකාගාර වල සිටීමට සිදු වුව හොත් කෑම බීම ටික වත් සොයා ගැනීමට නොහැකි වන හෙයිනි. ඒ අනුව සේවකයින් රෝගී තත්වයන් සඟවමින් සේවයට පැමිනීමට වගබලාගෙන ඇති අතර, පාළකයින්ද මෙය දැන දැනත් ආයතන පවත්වාගෙන යාමට කටයුතු කරමින් සිටී. එමෙන්ම රට ලොක්ඩවුන් කර ඇති නමුත් මෙම ඇඟළුම් ඇතුළු අපනයන ක්ෂේත්‍ර අත්‍යවශ්‍ය සේවාවන් කර ඔවුන් අඛංඩව සේවයේ යෙදවීමට වගකිව යුත්තන් කටයුතු කර ඇත. මෙය ඉතා අවාසනාවන්ත හා බරපතල තත්වයක් වන අතර මෙම ප්‍රශ්නය විසඳීම සඳහා කිසිදු වගකිවයුතු පාර්ශවයක් මැදිහත් වීම සිදු කරන්නේ නැත. ආණ්ඩුව නිළ වශයෙන් මෙම වගකීමෙන් ඉවත් වී ඇත. කම්කරු අමාත්‍යාංශය නිද්‍රාසීලී පිලිවෙතක නියැලී ඇත. පාලකයින් දිගින් දිගටම අසාධාරන කම්කරු පිලිවෙත් :මබ්සෙර ක්ඉදර චර්ජඑසජැ* වල යෙදෙමින් සිටියද කිසිවකු ඒවාට කිසිම විරෝධයක් නොදක්වයි. අපි දිගින් දිගටම වගකිව යුතු ආයතන වලින් සාකච්චාවක් සඳහා අවස්ථාවන් ඉල්ලා සිටියද ඒ සඳහා කිසිදු යහපත් ප්‍රතිචාරයක් මේ දක්වා පෙන්වා නොමැත.

අනෙක් අතින් මෙම ඉතා අවාසනාවන්ත හා බරපතල තත්වයට ආණ්ඩුව සෘජුවම වගකිව යුත්තේ , පළවෙනි රැල්ල ආරම්භ වනවාත් සමඟම ආරම්භ වූ කාර්ය සාධක බලකා සාකච්චාතුල, මේ සම්බන්ධව කටහුතු කිරීම සඳහා සේවක නියෝජනයක් සහිත සෞඛ්‍ය කමිටු පිහිටුවීමට යෝජනා කෙරුනු නමුත් , මේ වනවිටත් එම කමිටු පිහිටුවා ගැනීමටත්, ඒවා නියාමනය කිරීමටත් රජය අසමත් වීම තුලයි. මේ වන විටත් කිසිවෙකුට ඇහුම්කම් නොදෙමින් ආණ්ඩුව ඉතා අත්තනෝමතික ක්‍රියා පිලිවෙතක නියැලෙමින් සිටී.

මෙහි ප්‍රතිඵලයක් ලෙස සේවකයින් නේවාසිකාගාරයන්හි කුසගින්නේ හා දැඩි අනාරක්ෂිත තත්වයක කම්පනයට පත්ව සිටී. ඔවුන්ට කඩසාප්පු වලින් ද්‍රව්‍ය හා භාණ්ඩ අලෙවියද ප්‍රතික්ෂේප කරමින් සිටී. ආසාධිතව නේවාසිකාලාරයන්හි සිටින විට නේවාසිකාගාර හිමියන්ද විවිධ බලපෑම් එල්ල කරමින් ඔවුන් අපහසුතාවයන්ට ලක් කරමින් සිටී. නමුත් මෙම කාළ පරිච්චඡේදය වන විට රටේ තීරනාත්මක කණ්ඩායම ලෙස ඉදිරියෙන්ම සිටින මෙම කණ්ඩායම, ප්‍රායෝගික ජීවිතයතුල රටේ දෙවන පුරවැසියන් ගණයට තල්ලු කර හමාරය.

මෙහිදී මෙම සේවකයන්ගෙන් 80 ආසන්න පිරිසක් කාන්තා ශ්‍රමිකයින් වන අතර සමස්ථයක් ලෙස ගත්කල නිෂ්පාදන හා සේවා ආර්ථිකයතුල වැඩි ප්‍රතිශතය කාන්තාවන් වේ . මෙම කොවිඩ් ව්‍යයවසන තත්වයතුළ කාන්තාවන් මත මුදාහැරුනු හිංසනය උපරිම තලයක් දක්වා ගමන් කිරීමට මෙම පසුබිම සෘජු ලෙස බලපා ඇත. පවුල් පෝෂනය කිරිම් හා නඩත්තු කිරිම් , දරුවන්ගේ අධ්‍යාපනය, ආරක්ෂාව ආදී සියළු කාරනාවන් කාන්තාව මත කේන්ද්‍රගත වූ අතර එහි ප්‍රතිඵලය විසින් ඔවුන් ඔවුන් කායිකව , මානසිකව, වාචිකව හා ලිංගිකව බරපතල ලෙස සූරා කෑමට ලක්කරමින් තිබේ.

අශීලා දන්දෙණිය
Stand-Up Movement

**මාරියාවේ මාරියාවේ මාරියාවේ ................**

**ඔහේ නවතින්නේ සමාවෙලා මේ දූක අහපන්නේ**

**නුඹ ආදා සිට පැල අඳුරේ මයි විරහාතාප සෝගිනි ඇවිලෙන්නේ**

**මේ දූක් දෙන්නට ඇයි නුඹ එන්නේ //**

**වලාලයට ඉඬදී පලයන්නේ**

ධීවර ප්‍රජාව අතරින් අතිශයින්ම පීඩිත ජනකොටසක්වන සුළුපන්න ධීවරයාගේ ජීවිතයට ස්වභාව ධර්මයාගේ බලපෑම පැහැදිලි කරදෙන අනගි ගීතයකි මෙය. නිරිත දිග මෝසම් සමයේදී නිරිත, බටහිර සහ වයඹ මුහුදු තීරයේ ධීවරයාත් ඊසාන දිග මෝසම් සුලං සමයේදී උතුරේ සහ නැගෙනහිර ධීවරයාත් මෙම තත්වය තුල අසරණවූ බව ගුණදාස කපුගේ ශූරීන් ගැයූ මෙම ගීත ඛණ්ඩය ඔබට පසක් කරදෙනු ඇත. එය අදටත් හෙටටත් වලංගු සදාතනික පීඩනයකි. මෙහිදී තෙප්පමේ හෝ වල්ලමේ යන, පොඩි බෝට්ටුවේ රැකියාව කරන හෝ මාදැල් ආශ්‍රිත කම්කරු ප්‍රජාව හෙවත් පීඩිතම ධීවර ප්‍රජාව මෙමගින් විපතට පත්වන බව සිහිපත් කල යුතුය. මෙය සදාතනිකව සිදුවුවත් රජයට හෝ ධීවර සංවිධාන වලට මෙතෙක් නිසි පිලිතුරක් ලබාදීමට නොහැකිවීම නිසා ඇතිවන බලපෑම මෙහිදී දීර්ඝව සදහන් කිරීමට උත්සාහ නොකරමි.

වෙරළාසන්න ධීවරයා මුහුණ දෙන තවත් එක් ප්‍රධාන ගැටළුවක් වන්නේ නිරන්තරයෙන් ඉහල යන යාත්‍රා දැල් පන්න එංජින් හා ඒවායේ අමතර කොටස් වල මිල මෙන්න දිනෙන් දින ඉහල යන ඉන්දන මිල හමුවේ තමන්ට කිසිදු ආකාරයක විකල්පයක් නොමැති වීමයි.  මෙම සීඝ්‍රයෙන් ඉහල යන මිල ගනන් පිලිබදව නොසලකා හැරීමට නොහැකිව ඇත්තේ තමන්ගේ ආදායම මගින් මෙම වියදම් ආවරණය කරගැනීමට ඉතාමත් අපහසුව ඇති බැවිනි. එයට හේතුව වන්නේ වියදමට සරිලන ආදායමක් ලබා ගැනීමට ලැබෙන අස්වැන්න ප්‍රමාණවත් නොවීම මෙන්ම ලැබෙන සීමිත අස්වැන්න පිලිබදව මිල තීරණය කිරීම සදහා කිසිදු ඉඩක් සුළුපන්න ධීවරයින්ට නොමැතිවීමයි. නමුත් මෙහිදී පාරිභෝගිකයින් හා නිෂ්පාදකයා යන දෙපිරිස මැද සිටින අතරමැදියාගෙන් දෙපිරිසම ආරක්ෂා කරන වැඩ පිලිවෙලකට යාමට කිසිදු රජයකින් සැකසෙන වැඩ පිලිවෙලක් පිලිබදව වෙළදපොල ආර්ථික ක්‍රියාවලියක් තුල අපේක්ෂා කල නොහැකිය. සූරාකෑම සදහා වෙළදපොල ශක්තිමත් කරන ක්‍රියාවලියක් හැර වෙනත් විකල්පයකට යාම ධීවර සමූපකාර සමිති හෝ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක සංවිධාන අතර සංවාදයක් ඇරඹිය යුතුය.

දිනෙන් දින ධීවරයා මුහුණ දෙන තවත් අසීරු යථාර්තයක් වන්නේ ධීවරයා නෙලන මසුන් ප්‍රමාණය දිනෙන් දින පහත වැටී තමන්ගේ ස්වාධීන ධීවර කටයුතු අතහැර බහුදින යාත්‍රා කම්කරුවෙකු බවට පත්වීමයි. තමන් දන්නා එකම ජීවන මාර්ගය මහ මුහුද සමග පොරබැද මසුන් නෙලීමේ කාර්යය බැවින් ඒ සදහා වෙනත් මුදලාලි කෙනෙක් යටතේ බහුදින යාත්‍රාවක රැකියාව කිරීම හැර වෙනත් විකල්පයක් නැත. මෙම ක්‍රියාවලියේදී බහුදින යාත්‍රාවල කම්කරුවන්ගේ ජීවිතය හා ඔවුන්ගේ වෘත්තීය කරුණු පිලිබදව පසුව ලිපියකින් සවිස්ථරාත්මකව සලකා බලමු. නමුත් සුළුපන්න ධීවරයන් මුහුණ දෙන මෙම භයානක යථාර්තයට හේතුවී ඇති කරුණු කෙටියෙන් හෝ සලකා බැලිය යුතුය. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය අධ්‍යන කර ඇති පරිදි වෙරළාසන්න ධීවර හෝ ජලජ සම්පත් වල සිදුවන සීමිත බව පැහැදිලිව සටහන් කර ඇත. අපගේ ධීවර ප්‍රජාව අතරින් බහුතරයක් තමන්ටගේ ජීවිකාව සලසාදෙන මහ මුහුදට අසීමිතව ආදරය කරති. නමුත් කෙටිකාලීන වාසි තකා අසීමිතව සම්පත් නෙලීමට උත්සාහ ගන්නා ව්‍යාපාරිකයින්ගේ මෙහෙයවීමෙන් රත්තරන් බිත්තර දමන කිකිළිය මරා ගෙන ඉක්මනින් පොහොසත් වීමට සුළුතරයක් පිරිස ගන්නා උත්සාහය හමුවේ අතිශය බහුතරයක් සුළුපන්න ධීවරයාත් ඔවුන්ගේ පවුලත් අසරණවේ. මෙහිදී සදහන් කලයුතු කරුණක් වන්නේ මෙම තත්වය තුල බරපතල ලෙසම අසරණ වන පිරිස පවුලේ කාන්තාවන් බවයි. ඒපිලිබදවද කථා කිරීමට මෙම ලිපිය ප්‍රමාණවත් නොවන බව පමනක් මෙහි සදහන් කරමු.

ඒ අනුව මෙම තරගකාරිත්වය නිසාම සම්පත් වල තිරසර භාවිතයේ ඇති ගැටළුව වෙරළාසන්න සුළුපන්න ධීවරයා කෙටිකාලීනව පමනක් නොව දිගුකාලීනව කර්මාන්තයෙන් අතුගා දැමීමට හේතුවී ඇත. යොදාගන්නා පතුල ට්‍රෝලිංකරණය, ලයිලා, සුරුක්කු හෝ ලයිට් කෝස් වැනි දැල් ආම්පන්න වල ඇති ස්වභාවය මෙන්ම ඩයිනමයිට් වැනි විනාශකාරී ක්‍රියාවලීන් නිසා ජලජ පරිසර පද්ධතීන් විනාශකර දැමීමෙන් තමන්ගේම ජීවිකාව හා අනාගතය විනාශ කරගන්නා බව වටහා නොගැනීම අවාසනාවකි. නමුත් මෙම කරුණ පිලිබදව 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් කලමණාකරන පනතේ අඩංගු විධිවිධාන ක්‍රියාත්මක කරවා ගැනීම සදහා රාජ්‍ය නිළධාරීන් සමග නිරන්තර සංවාදයක නිරතවන ප්‍රජානායකයින්ද නැතුවා නොවේ.

වෙරළාසන්න කොරල් පර විනාශය මුහුදු පැලෑටි විනාශය හා කඩොලාන සම්පත් හීන වීමෙන් අප ධීවරයා මුහුණ දෙන ගැටළුකාරිත්වය පිලිබදව අප දීර්සව සංවාද කලයුතු අතර මෙම කරුණ පිලිබදව මෙම ලිපියෙන් පැහැදිලි කරදීම අපහසුය. නමුත් උතුරේ ධීවර ප්‍රජාව අපරටේ සම්පත් සූරාකෑමට ඉන්දියාවෙන් පැමිනෙන පතුල ට්‍රෝලිංකරණය කරන යාත්‍රාවන්ට එරෙහිව අඛණ්ඩවම අරගලයක නිරත වෙමින් මෙම ට්‍රෝලිං යාත්‍රා අපගේ මුහුදෙන් ඉවත් කරන ලෙස ඉල්ලීම අතිශය සාධාරණ ඉල්ලීමක් බව පැහැදිලි වනු ඇත. එනම් කෙටිකාලීනව අද අපට ඇති සම්පත සූරාගන්නා අතරම දිගු කාලීනව අපගේ පරිසර පද්ධතීන්ට සිදුකරන බලපෑම වලක්වා ගැනීම හැර වෙනත් මගකින් තිරසර ධීවර කර්මාන්තයක් නොමැති බව අවම වශයෙන් උතුරේ ධීවරයා වටහාගෙන ඇති බැවිනි.

වෙරළාසන්න භූමිය, කලපු හා ඒ ආශ්‍රිතව ඇති කඩොලාන පරිසර පද්ධතීන් ජලජීවි වගාව මෙන්ම සංචාරක කර්මාන්තය සදහා භාවිතයට ගැනීම මගින් එක් අතකින් ධීවරයාගේ භූමියෙන් ඔවුන් එලවාදැමීම සිදුකරන අතර කඩොලාන විනාශය මගින් පරිසරයද විනාශ කරමින් ඔවුන්ගේ ජීවන මාර්ගවල තිරසර පැවැත්මද අහිමි කරදමයි.

කෝවිඩ් වසංගතය මුළු ලොවටම දැඩි බලපෑමක් සිදුකල බව පැහැදිලිය. නමුත් එමගින් ශ්‍රී ලාංකීය ධීවර ප්‍රජාවට ඇතිකල බලපෑම අපගේ අවධානයට යොමුකල යුතු සුවිශේෂී කරුණකි. එය අපි ඉදිරියේදී කථාකල යුතු තවත් කරුණකි. කෝවිඩ් තුන්වන රැල්ල මැද පසුගිය ජුනි මස මැද්දී ඉන්ධන මිලද ඉහල දැමීමට රජය තීරණය කිරීම අපගේ ධීවරයා කබලෙන් ලිපටම ඇද දැමීමට හේතුවූ කරුණකි. ඒ ඉන්ධන මිල ඉහල දමන අවස්ථාව වන විටදී එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනිගෙන රසායන ද්‍රව්‍ය හා ප්ලාස්ටික් අමුද්‍රව්‍ය (Plastic Nerdles) බිලියන ගනනක් බටහිර මුහුදු තීරයට එක් කරමින් සිදුකල විනාශය නිසා ධීවර ප්‍රජාව අසරණව සිටි බැවිනි. මෙමගින් ධීවර ප්‍රජාවට සිදුකල අහිතකර බලපෑම පිලිබදව නිවැරදි තක්සේරුවක් කරගත යුතු අතර දිනපතා කැස්බෑවන් තල්මසුන් ඩොල්පින් හා විවිධ මත්ස්‍ය වර්ග වෙරළට ගොඩ ගැසීම නිසා සාමාන්‍ය ජනතාව මසුන් ආහාරයට නොගැනීමට පෙළඹීමෙන්ද ධීවර ප්‍රජාව යලිත් අනතුරට වැටුනි. මෙම තත්වයට අපගේ ධීවරයා මුහුණ දෙන්නේ වාරකන් නිසා අසරණව සිටින අවස්ථාවක වීම තවත් කරුණකි. මෙම සියළුම තත්වයන් පිලිබදව අපි වැඩිදුර අවධානය යොමුකල යුතුය. අප මෙහිදී අවධාරණය කල යුතු කරුණක් වන්නේ මෙම සියළු දුෂ්කරතාවයන්හිදී ධීවර පවුලේ කේන්ද්‍රීය කාර්යය භාරය ඉටුකරන්නේ ධීවර කාන්තාව බැවින් අපි එය වෙනම සංවාද කල යුතු බවයි.

ධීවර ප්‍රජාවගේ රටට දක්වන දායකත්වය පිලිබදව ප්‍රමාණවත් අවධානයක් යොමුව නොමැති අතර ඒ සදහා ක්‍රියාකාරී සංවිධාන මෙන්ම ධීවර ප්‍රජාවද අවධානය යොමුකල යුතු කරුනකි. ලෝක කම්කරු සංවිධානය සදහන් කරන පරිදි ලොවේ දෙවන භයානක වෘත්තියේ නිරතවන ධීවර ප්‍රජාව පිලිබදව ලොවේ අවධානය යොමුව ඇත. එබැවින ධීවර ප්‍රජාවගේ ඇති ආපදාපාත්‍රී ස්වභාවය නිසාම වසර 2007 දී මහ මුහුදේ ආරක්ෂාව පිලිබදව ලෝක කම්කරු සංවිධානය මගින් එහි 188 වන සම්මුතිය සම්මත කරගන්නා ලදී. එසේම සුළුපන්න ධීවර ප්‍රජාව ආහාර සුරක්ෂිතතාවයට පෝෂණයට රැකියා ජනනය කිරීමට සහ දුප්පත් කම පිටුදැකීම පිලිබදව ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය වසර 2014 දී සුළුපන්න ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාවය සදහා මගපෙන්වීම් මාලාවක් සම්මත කරගන්නා ලදී.

ධීවර ප්‍රජාවට අදාල අවම පැවැත්ම සහතික කරන ඉහත සම්මුතීන් හා මගපෙන්වීම් මාලාවන් අපරට තුල සම්මත කරගැනීම මගින් යෝග්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමට රජයට හා සමාජයට මගපෙන්වීමක් ලබාගත හැකිබව අපගේ විශ්වාසයයි. මේ සදහා යම් නිමිත්තක් අප ඉදිරියේ ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් 2022 වසර එක්සත් ජාතීන්ගේ සුළුපන්න ධීවරයින්ගේ හා ජලජීවී වගා වර්ෂය ලෙස ප්‍රකාශයට පත්කර ඇත. ධීවර ප්‍රජාවගේ යහ පැවැත්ම සහතික කරමින් ඔවුන් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවයට, ප්‍රෝටීන හා ශරීරයට අත්‍යාවශ්‍ය ඇමයිනෝ අම්ල හා ක්ෂුද්‍ර පෝෂ්‍ය ද්‍රව්‍ය මගින් ඉටුකරන පෝෂණයට හා දුප්පත්කම දුරලීම හා රැකියා ජනනය සදහා ලබාදෙන දායකත්වයේ වැදගත්කම අවධාරණය කරමින් මෙම ප්‍රජාවගේ වසර වඩා පලදායකව යොදාගැනීමට අපි ක්‍රියාකාරීව දායක වෙමු.

හර්මන් කුමාර
ජාතික කැඳවුම්කරු
ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය
2021 ජුනි මස 25 දිනදීය

23 May, 2021

## For media attention and publicity

### Employers and Labour Dept. responsible for island wide COVID-19 spread in factories

Last few days had reports of large numbers of apparel sector workers falling victim to COVID-19 virus spread. After MAS Group owned Unichela factory in Panadura with around 1,500 workers and their Thulhiriya export complex with over 8,000 workers reporting large numbers of workers testing positive, Labour Minister had reportedly instructed the Labour Department to investigate into the Thulhiriya spread. A similar investigation was ordered after the Brandix factory in Minuwangoda reported mass infection in October last year. But the outcome of that investigation is yet unknown.

Meanwhile, a factory in Bandaragama was reported closed due to COVID-19 virus infection of workers. Infection of workers were also reported from factories in Norwood, Pallekele and Mullaitivu.

Over a month ago, the Stretchline garment factory in Ridimaliyedda owned by MAS Group reported infections among workers and the death of a worker as well. According to our network of district co-ordinators, a few weeks ago factories in Mirigama, Galigamuwa, Avissawella, Kegalle, Mawanella, Hasalaka had reported infections among workers. In some places villagers had demanded closure of factories. Some were anyway closed by management.

Unichela, Brandix, Esquel, Star One and Star Two factories in the Koggala FTZ had reported over 800 COVID-19 positive cases at present, according to our district co-ordinators. More serious of them are housed in a temporary "hospital" leased out by MAS Group in Kalugala, Habarduwa. Some Brandix and Esquel workers are also treated in there.

Workers had said, their hostel area has been isolated and locked down with no commuting allowed in and out of the area. They had said the worst is that they are not served in local groceries with allegations that it is apparel workers who spread the COVID-19 virus.

Majority of the positive numbers are quarantined in homes. There are complaints that some do not have proper meals served.

It was also said, the smaller factories do not conduct PCR tests and therefore the status of worker infections in them are not known.

The other sad news received while this was being drafted is that of the demise of the Engineer at Star Garments factory, Koggala after being seriously ill from COVID-19 virus infection.

In Katunayake FTZ by 17 May last, the Next factory that reported over 100 positive cases, had provided vaccination for 260 of their workers on a priority basis decided by the management. There were also reports to the effect Magpack factory workers would be vaccinated. Global Lanka has begun PCR testing for its workers, but with PCR test reports getting delayed, workers complain they are compelled to work with those who may be positive from tests conducted.

According to information received from our co-ordinators, situation is serious in the Pudukudiyirippu divisional area in the Mullaitivu district than in Vavuniya and Kilinochchi. While workers who test positive are sent for quarantine, details of "first line contacts" of those tested positive are not made available. Even "contacts" themselves do not provide such details. A more serious issue is compelling pregnant women to

work till 07 months without concern for the infected in the workforce.

Most tragic COVID-19 outbreak was in the first week of October last year (2020) when Brandix factory workers in Minuwangoda were confirmed as positive. This spread to many areas in Minuwangoda, and reached the Peliyagoda fish market resulting in the second COVID-19 wave. Commenting on it, we were clear in saying the Brandix management should take total responsibility for this second wave. Continuously suppressing all efforts of workers in forming a trade union, the management was free to violate all COVID-19 prevention guidelines in exploiting workers as they wish. There is now reluctant acceptance of the fact this tragedy could have been avoided had there been a workers' trade union.

Necessity of establishing "Factory Health Committees" (FHC) with worker representation in all factories in the country was first discussed in the Tri-partite Task Force Committee chaired by then Minister of Labour, Dinesh Gunawardne. The Tri-partite Task Force Committee established under his chairmanship to resolve labour issues related COVID-19 was constituted by employers, workers' trade unions and the labour ministry. This Task Force took upon itself the responsibility of controlling the pandemic especially in the export manufacture sector.

We continued stressing the necessity of establishing FHCs with worker representation. In fact, we negotiated with the Joint Apparel Association Forum (JAAF) about establishing them. We have released our communications with JAAF to the media as well in an effort to promote social dialogue on FHCs.

We were aware that factories where hundreds of workers are collected daily for production are prone for COVID-19 infection spread and therefore health ministry guidelines for prevention must be monitored on a daily basis. We therefore stressed upon the necessity of establishing FHCs with worker representation decided by workers themselves along with other trade union representatives at the Tri-partite Task Force meetings.

It was finally decided to establish them with worker representation decided by workers themselves at the Tri-partite Task Force Committee meeting on 16 November 2020. It was also decided that the process of establishing these FHCs should be completed by 15 December 2020. At that same meeting, responsibility of ensuring the formation of FHCs was given to the labour department with Commissioner General of Labour to preside a weekly progress of the FHCs at the meeting of the sub-committee.

Yet with the labour department not making any effort to facilitate the formation of FHCs, as reported by our district trade union co-ordinators, no employer had allowed formation of FHCs. Employers knew too well, with such FHCs they will not be able to exploit the workers as they wish to.

This was more than evident last week at the Koggala FTZ Esquel factory. Out of the 1,500 workers there, 283 were tested positive. Thereafter another 733 were counted as "first line contacts" for self-quarantine. Public Health Inspectors (PHI) who went before the Additional Magistrate, Galle, said the management did not provide information and details of those who had to be quarantined and told open court, the factory management acted in a manner that allowed further spread of the pandemic.

Though this has become almost the normal trend at present, the Tri-partite Task Force Committee that met even during the total island wide lockdown under curfew, has not been convened after 03 March to discuss this evolving inhuman situation and necessary measures against them. As a member of this Task Force we have requested many times to at least convene the Task Force Committee through "zoom" platform every month. Yet that has not been heeded and the Task Force Committee remains defunct.

This year was begun with warnings by Experts of a possible COVID-19 third wave. End January, the government began immunisation on priority basis. While immunisation was on-going, priorities came to be amended and we appealed twice in writing to the President and the PM to accommodate export manufacture sector workers also as priority and conclude immunisation before end March this year. We are yet to have acknowledgements to those appeals.

Government's total neglect of export manufacture sector labour even during economic crisis during this COVID-19 pandemic is direct motivation for neglect of responsibilities by the Labour Ministry and the department. Most are aware neglect of responsibilities by the labour department is not due to their inefficiency or their incapacity, but for other reasons. Most also know that in the export manufacture sector with FDIs including apparels, employers have their say on issues, on their own terms. There were public allegations even before the COVID-19 pandemic that the Labour Department is more in favour of investments than workers' employment and welfare.

It should therefore be stressed here, the major reason for thousands of factory workers to have got infected in this manner is due to the irresponsibility of employers and the Labour Department. Their irresponsibility has not only left employees extremely insecure, but their families and their roommates too. Reason for employees to think their employment is insecure if factories are closed, is also because employees have lost trust in the Labour Department.

While employers and the labour department therefore should be held responsible for stalling social life and the economy, we wish to keep stressing that it could only be answered by carrying out a COVID-19 preventive healthcare programme through Medical Officers of Health (MOH) offices and include FHCs with worker representation. We therefore appeal to the government to direct relevant authorities to ensure all FHCs are registered with relevant MOH offices with details about committee members enabling PHIs to regularly monitor their activities.

Thanks

Anton Marcus

Joint Secretary

Free Trade Zones & General Services Employees Union

# කොවිඩ් අර්බුධය හමුවේ නිදහස් වෙළඳ කලාප

කොවිඩ් ගෙවන රැල්ල මේ වන විට ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප සියල්ලම පාහේ ආක්‍රමණය කොට අවසන්ය. අඩු වැඩි වශයෙන් එකී වෛරසයේ බල පෑමට මේ වන විට බොහෝ සේවක සේවිකාවන් බඳුන් වී ඇති අතර මේ වන විට කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ආයතන 67 කින් කොවිඩ් ආසාදිතයින් වාර්තා වේ. එසේම පානදුර කලාපයෙන් කම්කරු මරණ තුනක් කටුනායකින් මරණ දෙකක් පිදිමාලියද්ද සහ කොග්ගලින් කලාප වලින් එක් මරණය බැගින් වූ මරණ හතක් මේ වන විට ද නිල වශයෙන් වාර්තා වී ඇති පසුබිමක වුව මේ වන තෙක් කිසිදු බලධාරියෙකු නිදහස් වෙළඳ කලාපයේ කම්කරුවන් හට කොවිඩ් වෛරසය හේතුවෙන් මුහුණ දෙන්නට සිදුවන ගැටළු අවම කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කරන්නට සමත් වූ බවක් හෝ කිසිවෙකුට ඒ පිළිබඳව අවශ්‍යතාවක් පැවති බවක් නොපෙනේ. මේ වන විට නිදහස් වෙළඳ කලාපයේ ආයතන අනලොස්සක් ආයතනික මට්ටමෙන් යම් තරමකට ස්වකීය සේවකයන් සම්බන්ධව සාධනීය පියවරයන් අනුගමනය කරනත් බහුතරයකට මෙකී වෛරසය හේතුවෙන් විඳින්නට සිදුවී ඇති පීඩාවන් අපමණය.

වෛරසය පැතිරීම අවම මට්ටමක පවත්වා ගැනීම සඳහා පිළිපැදිය යුතු සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම වේදයන් අතර මුල් තැනක් ගිමි වන්නේ සමාජ දුරස්ථභාවය පවත්වා ගන්නටයි. ඒ සඳහා නිදහස් වෙළඳ කලාපයේ සැලකිය යුතු ආයතන ප්‍රමාණයක් ඉඩ සලසා ඇත. එහෙත් කම්කරුවන් බොහෝ පිරිසකට ඔවුන්ගේ නේවාසික ස්ථාන වලදී නම් සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමේ ඉඩකඩක් නොමැති තරම්ය. මේ වන විට කටුනායක නිදහස් වෙළඳ කලාපය තුළ එක් පීසීආර් පරීක්ෂණ වාරයකදී අවම වශයෙන් එක් ආයතනයකින් එක් අයෙක් හෝ ආසාදිතයෙකු ලෙස හඳුනා ගන්නා අතර ඇතැම් විටෙක එය ආසාදිතයන් පනළොව විස්ස තරම් ප්‍රමාණයක් දක්වා ඉහල යන අවස්ථා විරල නොවේ. එසේම ඇතැම් ආයතන වල මේ වන විට හඳුනාගෙන ඇති ආසාදිතයන්ගේ ප්‍රමාණය 100-300 තරම් ඉහළ අගයක් ගනී. වතුපිටිවල, බියගම සහ කොග්ගල නිදහස් වෙළඳ කලාප වලද පවතින්නේ මීට නොදෙවෙනි තත්ත්වයකි.

එමෙන්ම ආසාදිතයින් බවට හඳුනා ගැනෙන කම්කරුවන් වහා රෝහල්ගත කිරීමක් හෝ රැඳවුම් මධ්‍යස්ථාන කරා යොමු කිරීමක් බොහෝ විට සිදු නොවෙන අතර ඔවුන්ට දිනක දෙකක් නොඑසේනම් දින කිහිපයක් හෝ තම නේවාසික ස්ථානයේ නොඑසේනම් නිවෙස තුළ රැඳී සිටින්නට සිදු වන අතර ස්වකීය සම්පූර්ණ නිරෝධායන කාලයම නේවාසික ස්ථානයේම රැඳී සිටින්නට ඔවුන් හට සිදුවූ අවස්ථාද දකින්නට ඇත. එහිදී බොහෝවිට අසාදිත බවට පත්වූවන්ට සිදුවන්නේ ආහාර සකස්කර ගැනීම ඇතුළු අනෙකුත් අත්‍යාවශ්‍ය උවමනා එපාකම් තමා විසින්ම ඉටුකර ගැනීමට වන අතර එවන් අවස්ථාවලදී නේවාසික ස්ථානවල පවතින අවම ඉඩකඩ හේතුවෙන් අනෙකුත් සහෝදර සේවක සේවිකාවන් සමඟ ගැටෙන්ට ඇති අවස්ථා බහුලය. එපමණක් ද නොවේ ආසාධිතයන් හා එකම වැසිකිලි පාවිච්චි කරන්නට එකම ස්ථානයේ ස්නානය කරන්නට අනෙකුත් සේවකයන්ට සිදුවේ. යම් නේවාසිකාගාරයක එක් අයෙක් හෝ දෙදෙනෙකු අසාදිතයින් බවට පත් වුවද අනෙක් කම්කරුවන් නිරෝධායන කිරීමක් සිදු නොවන අතර ඔවුන් දිගින් දිගටම සේවයට වාර්තා කිරීම කළ යුතු වේ. බොහෝ විට මෙම නේවාසික ස්ථාන වල විවිධ ආයතන වල සේවය කරන කම්කරු පිරිස් නේවාසිකව සිටින හෙයින් ආයතනයෙන් ආයතනයට වෛරසය පැතිරීමේ අවදානමක් මෙමඟින් ඇතිවේ.

නිරෝධායනට වන සේවක පිරිස් වෙත කිසියාකාරයෙන් වැටුප් නොගෙවීමද මෙම කළාප වල පවතින ප්‍රධානතම ගැටළුවක් වේ. කම්කරු දෙපාර්තමේන්තුව විසින් පත්කරන ලද ත්‍රෛපාර්ශවීය කාර්ය සාධක බලකාය තීරණය කර ඇති වැටුප් ක්‍රම වේදය අවභාවිතා කරමින් ඇතැම් ආයතන නිරෝධායන කාලය තුළ වැටුප් ගෙවීම පැහැර හරින අතර ඇතැම් ආයතන එය වැටුපෙන් අඩකට සීමා කරයි. එසේම සමහර ආයතන නිරෝධායන දින ගනන කම්කරුවන්ගේ අනුමත නිවාඩු වලින් අඩුකරගන්නා අවස්ථා පිළිබඳවද වාර්තා වේ. එමෙන්ම ඇතැම් ආයතන නිරෝධායන ක්‍රියාවලියට බඳුන් වී සිටින සේවක සේවිකාවන් පිළිබඳව එකී නිරෝධායන කාලය තුළ කිසිදු සොයා බැලීමක් සිදු නොකරන අතර ස්වකීය ආයතනයේ සේවකයෙකු ආසාදිතයෙකු බවට පත්වූ විට ඒ පිළිබඳව අදාල සෞඛ්‍ය අංශ දැනුම්වත් කිරීමට හෝ පෙළඹෙන්නේ නැති අවස්ථා

දැකිය හැකි අතර එම සේවක සේවිකාවන් සඳහා කිසිදු ආකාරයෙන් ද්‍රව්‍යමය උපකාරයක් සිදු කරන්නට හෝ ඔවුන් කටයුතු කරන්නේ නැත. නිරෝධායන ක්‍රියාවලියට බඳුන්වීමට සිදුවන මැන් පවර් කම්කරුවන්ගේ තත්ත්වය ඊටත් අන්තය. එකී නිරෝධායන කාලය තුළ ඔවුන්ට කිසිදු වැටුපක් දීමනාවක් හෝ උපකාරයක් ආයතනික මට්ටමෙන් නොලැබෙන අතර ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් නොවන හෙයින් රජයෙන් ලබාදෙන සහනය හෝ ඔවුනට ලැබෙන්නේ නැත . මෙවැනි තත්ත්වයක් තුළ එදිනෙදා අවශ්‍ය ආහාරපාන අත්‍යාවශ්‍ය සෞඛ්‍ය උපකරණ ලබා ගැනීමේ උග්‍ර ගැටළුවකට ඔවුන් මුහුණ පා සිටින අතර ඇතැම් අවස්ථාවල නේවාසික ගාස්තු ගෙවීමට නොහැකිවීමේ හේතුවෙන් නේවාසික හිමිකරුවන් වෙතින් එල්ල වන විවිධ පීඩාවන්ට මුහුණපෑමට පවා සිදුවේ.

කර්මාන්තශාලා පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස නම් කර තිබුණද කොවිඩ් වෛරසයේ අහිතකර බලපෑමට වඩා වැඩියෙන් ලක්විය හැකි පිරිස් ආරක්ෂාකර ගැනීම සඳහා පවා මෙතෙක් කිසිදු වැඩ පිළිවෙළක් නිදහස් වෙළඳ කලාප තුළ ක්‍රියාත්මක නොවීම සැබවින්ම කණගාටුවට කරුණකි. ඒ සඳහා වන ආසන්නතම උදාහරණයක් වන්නේ කටුනායක වෙළඳ කලාපයේ සේවිකාවක පසුගිය දා වෛරසය නිසා මරණයට පත්වීමයි. ඇය පිලිකා රෝගයෙන් පීඩා විඳිමින් සිට ඇති අතර අවම වශයෙන් භාරාන්තිකයැයි සැලකෙන පිලිකා රෝගියෙකු හට පවා වෛරසය උත්සන්නව පවතින මෙවන් අවදියක හෝ ආරක්ෂාව සැලසීම පිළිබඳ කිසිවෙකුගේ අවධානය යොමුව තිබුණේ නැත. එසේම නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන ගර්භනී මව්වරුන් සහ කුඩා දරුවන් සිටින මව් වරුන් සම්බන්ධයෙන් මේ කාලය තුළ ක්‍රියාත්මක වන්නේ කෙසේද පිළිබඳව විවිධ ආයතන ආයතනික මට්ටමෙන් විවිධ තීන්දු තීරණ වලට එළැඹුනද ඔවුන් සම්බන්දව ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව මෙතෙක් පැහැදිලි තීරණයකට එළැඹී නැතුවා සේම ඒ වෙනුවෙන් මෙතෙක් කිසිදු වැඩ පිළිවෙලක් සැකසී ඇති බවක් දකින්නට නැත. අනතුරට මුහුණ පෑමට වැඩි අවදානමක් සහිත පිරිස් පිළිබඳව මේ වන තෙක් බලධාරීන්ගේ අවධානයට ලක්වී ඇති බවක් පෙනෙන්නට නැති තත්ත්වයක් තුළ නිදහස් වෙළඳ කලාපය ආශ්‍රිතව ක්‍රියාත්මක වන සංවිධාන එකමුතුව විසින් පසුගියදා නිදහස් වෙළඳ කලාප වල සේවය කරන ගර්භනී මව්වරුන් හටද වැටුප් සහිත නිවාඩු අනුමත කර දෙන ලෙස ඒකාබද්ධව ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටීමේ ප්‍රතිඵලයක් ලෙස කම්කරු කොමසාරිස්වරයා විසින් එසේ ගර්භනී කාන්තාවන්හට නිවාඩු ලබාදීම පිළිබඳව සලකා බලන ලෙස ඉල්ලමින් බීඕඅයි ආයතනයේ සභාපතිවරයා වෙත ලිපියක් යවා ඇත .

නිදහස් වෙළඳ කලාප තුළ එන්නත් කරණයද සැලකිය යුතු තරමේ සාර්ථක බවක් පෙන්වන්නේ නැත. ඇතැම් ආයතන ස්වකීය සේවක සේවිකාවන් බහුතරයකට එන්නත ලබදී ඇති අතර ඇතැම් ආයතන ඒ පිළිබඳව උනන්දුවක් දක්වන බවක් පෙනෙන්නට නැත. එසේම පීසීආර් පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රම වේදයද ආයතනයෙන් ආයතනයට වෙනස් වේ. ඇතැම් ආයතන ආසාදිතයින්ගේ ආසන්න පදනම මත හෝ අහඹු තෝරා ගැනීමේ පදනම මත නොඑසේනම් යම් රෝග ලක්ෂණයක් පෙන්වන ආයතන සේවකයින් සඳහා එකී පරීක්ෂණ සිදු කරන නමුදු ඇතැම් ආයතන ස්වකීය ස්වකීය සේවකයන් හට පවසන්නේ මහජන සෞඛ්‍ය කාර්යාලය වෙත ගොස් එකී පරීක්ෂණ සිදුකර ගන්නා ලෙසයි. එසේම ඇතැම් ආයතන මේ වන විට පීසීආර් පරීක්ෂණ වෙනුවට ඇන්ටිජන් පරීක්ෂණය සිදුකරමින් සිටින අතර ඇතැම් විට පරීක්ෂණ සිදුකරන ප්‍රමාණය අවම කරමින් සිටින අතර ඇතැම් ස්ථානවල ක්‍රමානුකූලව එකී පරීක්ෂණ අඩු කිරීමේ ප්‍රවණතාවයකට අනුගත වෙමින් සිටින අවස්ථා පිළිබඳවද වාර්තා වේ. ඒ තුළින් ඔවුන්ගේ නිෂ්පාදන අඛණ්ඩව පවත්වාගෙන යාම එකී පාලකයන්ගේ අරමුණ විය හැකි බව සේවකයෝ පවසති.

ඉතාමත් භයානක වෛරසයක් සීඝ්‍රයෙන් රට තුළ ව්‍යාප්ත වෙමින් පවතින තත්ත්වයක් තුළ අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස කර්මාන්තශාලා පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නේ නම් ආයතන වල පාලනාධිකාරියේ උවමනා එපාකම් මත පමණක් තීන්දු තීරණ ගන්නට ඉඩ නොතබා සියළු ආයතන සඳහා යම් පොදු නීතියක් ස්ථාපනය කරමින් ඒ කම්කරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පිළිබඳව නියාමනය කරන්නට බලධාරීන් මැදිහත් විය යුතුවා මෙන්ම මැන් පවර් කම්කරුවන් පිළිබඳවද යම් අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය බැව් අපගේ අදහසයි.

RED- katunayake

# මාතලේ ගොවි හැඬේ...

1) පොහොර හිඟකාරකම. (රසායනික පොහොර හා එවාට ගැලපෙන කෘෂි රසායන ද්‍රව්‍ය.)
2) බීජ හිඟකාරකම.
3) වැදගත් බීජ සඳහා කාබනික පොහොර ප්‍රමාණවත් නොලැබීම.
4) බීජ හා පොහොර සඳහා අධික මිලක් ගෙවීමට සිදුවීම හා ද සිසි අවදානම් ගෙවීම.
5) කෘෂිකර්මයේ අවදානම් සිදුවන ගැටළු පුදුම මෙලෙසලන් ගෙවීම.
6) බෝග විනාශ කිරීමේ ආහාරවල සිදු වූ අහිතකර වියදම් (වගාව, ගොම්බලුවා, පෙට්‍රල් ආදී) ගෙවීම, කළ විට ගනී ද වාසියක් නෑ. වියදම් අධික වූ සියල්ලක් විශාල ගොවීන් මිය.
7) සැප්තැම්බර් මාසයේ ගොවීන් කරන්නේ වගා කරන පිළිබඳ කළින් උපදෙස් ඉදිරිපත් කිරීමට නොහැකි වීම.
ගොඩ හා බැහැර කෘෂි කිරීමට නොහැකි සිරිත වීම.
8) වගා කරන මාසවල විශාල ප්‍රමාණයක් දැමුව ද මේ ගොවි ආදායම් පෙරළීම.
9) වගා කළ ඒ මාසවල අවුරුදු බෝග වගා සිදු කළ ද මේ කල ඒ රටවල
අවුරුදු බෝග වගා කරන්න වී ගැනීමට නොහැකි වීම.
10) කෘෂි ගොවීන් දිගට මිල විකුණු දෙන මිල ගැනීමට යම.
11) අපේ 50 kg ක පොහොර මිල රු 1000.00 ක් වගේ විය, නමුත් අද වන විට 25 kg ක
පොහොර මල්ල රු 5500.00 ක වගේ විය.
12) බෝංචි 1 kg ක අස්වැන්නක් ලබා ගැනීමට ගොවි (බෑල් බැඳීමට ලී) 1000 ක් අවශ්‍ය
අවශ්‍ය වේ. කලින් රු 02.00 ට ගත් ගොවි අද රු. 07.00 ක් මිලට විට නිසා
බෝංචි වගා කිරීම අධික මුදලක් වැය වීම. (රු 7.00 x 1000 = රු. 7000.00)
13) බෝංචි පෙර අස්වැන්න පෙර ලැබුණු බෝග අස්වැන්න මේ කල වගාවට ලැබෙන බෑල්
බෝංචි වලින් එතරම් අස්වැන්නක් නොලැබීම.
14) අපේ වගාවන් සඳහා රෙදි ලබන අද වන විට දෙගුණයකින් පෙනුණ ද ඉතා අස්වැන්නක්
ලබා ගැනීම නොහැකි වීම.
15) බෝංචි බෑල් ඇඳීමට ගසක බැඳී සඳහා ගොවි ලණු ගෙනුම ද නැතිනම් ප්ලාස්ටික
ආයතන මගින් ඒ සඳහා කළු රෙදි වැනි ද්‍රව්‍යයන් සඳහා ලබා රෙදි ප්‍රමාණ මම නැති
සැලසුම ගොඩ ගැනීමට සිදු වී ඇති නිසා අමතර වියදමක් දැරීමට සිදු වීම.
16) අපේ පැදි මෙගුලර් අධික ලෙස ලබා දුන්නේ නිසා ගොවිතැනට, පරිභෝජනයට
දැඩි අවධානය සිදු වීම.
නි. දු :- අපේ රු 20.00 ක කෘෂිකර්ම ගොඩ පරිභෝජනයට 1 kg (කොළ) රු 120.00
ක වැනි මිල මිලකට විකිණීම.

17) පාන්දර 02.00 වෙත වන විට ආර්ථික මධ්‍යස්ථානය වෙත ගොස් අයිතිවාසිකම් ගෙන ආ යුතුය,
එසේ නොහැකි වුවහොත් ද එම අයිතිවාසිකම් හිමි වීමට මුදල් ගර ගැනීමට නොහැකි වීම.

18) අස්වනු ගබඩා කිරීම ඇල බිලි ගබඩා ගෙන යාම නිසා අස්වනු වලට හානි සිදුවීම, ඒ හේතුවෙන් ඊළඟ අස්වනු වලට [illegible] ගොවීන් ඉතා අසීරුවට පත්වේ.

19) නැවත අස්වනු විකිණීම නිසා ගෙවිය යුතු ණය මුදල් ලබා ගැනීමට සිදු වීම.

20) කෘෂි අමාත්‍යාංශ සැලකිල්ල නිසා ඉහළ ගිය අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගත අවශ්‍ය ප්‍රමාණයට
ලබා ගැනීමට නොහැකි වීම.

21) රාජ්‍ය ආයතන මගින් අඩු මිලට ලබා ගත හැකි ද්‍රව්‍ය ප්‍රමාණවත් නොවීම නිසා එම
ද්‍රව්‍ය පෞද්ගලික ආයතන වලින් ලබා ගැනීමට සිදු වීම නිසා අධික මිලක් මුදල් වියදම් වීම.

22) අස්වනු වලට හානිකර කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය නිසා ගොවීන් විවිධ රෝගාබාධ වලට
ගොදුරු වීම.

23) තාක්ෂණික විශේෂඥ දැනුම ගොවීන් වෙනුවෙන් ලබා දීම අද ප්‍රදේශයේ ගොවීන්ට අවශ්‍ය දැනුම
හා අවබෝධය ලබා දීම තාක්ෂණික නිලධාරීන් ද ඉතා අඩු වීම.

**නිරී. ශු :-**

ගොවීන්ගේ පෞද්ගලික අදහස් කිහිපයක් ද පහත දැක්වේ.

- [illegible] ගොවීන් [illegible] සමඟ හොඳ සබඳතාවයක් ඇත ද, මෙලෙස සාමාන්‍ය ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්ත ක්‍රියාත්මක වූවත් ගොවීන් අපේක්ෂිත වැඩ සටහන් බවත්, එම ඒත් ප්‍රදේශයේ ගොවි ජනතා සම්බන්ධ කර ඇතැම් ප්‍රධාන දායකත්වය ලබා ගත හැකි බව ගොවීන් පෙන්වා දෙති.
- අප ප්‍රදේශ ඇල්ල ගොවීන් හා අමුද පොළොන්නරුව ප්‍රදේශයේ විශාල වශයෙන් ගොවීන් සඳහා සිදු කරන ගොවීන් ලබා ඇති බවයි.
- රජය [illegible] ගොවීන්ට සහාය දක්වන බව.
- වියළුණු ප්‍රදේශ වලට ලබා ගොවීන් වෙත පොහොර ලබා දීම ක්‍රියා කරන බව.
- ප්‍රදේශයේ ගොවීන් විශාල සංඛ්‍යාවක් ද ඇති බව.
- අප ප්‍රදේශයේ විශාල ප්‍රමාණයක් කිහිපයක් ද අද වන විට රජය ආයතන මගින් අනුමත කරන ලද නිසා ප්‍රදේශයේ විකාශ වීම.
- ගොවීන් වගා ක්‍රමවේදයන් අනුව අදට විශාල අභිවෘද්ධියක් ලැබුණු බව.
- ගොවි බිම් ප්‍රදේශ වල ජීවත් වන ගොවීන් ද අධික වියදම් කෘෂි කටයුතු දිගු කාලයක් [illegible] ගොවීන් මිළ වී ඇත.

* අපේ පාසලට මේ ගොවිපොළට නිසි රැකවරණය ද්‍රව්‍ය කිසිවක් ආරක්ෂා නොකර එළවළු ජීවමානවත් එසේම මේ ආකාරයට සිදු කර ඇති බව.
* එම පාසලේ ළමයින් කෘෂිකර්මයට උනන්දුවක් නොමැති බැවින් එනම් උපකරණ ආදිය මුදල් වැයකර ගත යුතු ආකාරය නිසා එම. ඉතා අකාර්යක්ෂම ලෙස බව.
* උනන්දුව හා උපකරණ (අත්වැසුම්, ගොහ ඇතිම...) සමාජයෙන් ඇතැම් විට තිබෙන පුද්ගල ආරක්ෂාව හා පුද්ගලයින් අතර ඇති අසංසිඳියාව ඇති වී ඇති බව.
* එමෙන්ම කාර්මික දියුණුව නිදා ගෙන ගොවිතැනේ වැඩුණ බවයි.

කණ්ඩායම් ලේඛන ගැනීම :- • P.A. කුසුමාවතී.
• රමණ කුමාරි.
• M.K.B. ශ්‍රීලා ධර්මසේන.

වර්ණන සකස් :- W.M.D. ධම්මිකා සමරසිංහ බණ්ඩාර.

ඡායා හා ඊ-සංස්කරණ :- U.P. කමල්,
W. මාලිනී.

සංස්කරණ ලේඛන ගැනීම හා :- W.M.D. ධම්මිකා සමරසිංහ බණ්ඩාර.

2021/06/23
Chamika

[signature]
2021/06/23
මා/දි : ....

[signature]
2021/06/25
මා/දි/....

[stamp] ... ජාතික පාසල ...

# College of Community Physicians of Sri Lanka

'Wijerama House', No 6, Wijerama Road, Colombo 07
0112673345
http://www.ccpsl.lk

**Council Members 2020/2021**

**President**
Dr. Nihal Abeysinghe
Tel: 0777199524 (M)

**President Elect**
Dr.Lakshmi Somatunga
Tel.0722809577 (M)

**Vice President**
Dr.Sudath Samaraweera
Tel-0777909467 (M)

**Immediate Past President**
Dr.Sapumal Dhanapala
0714429793 (M)

**Secretary**
Dr.Anuji Gamage
Tel: 0717792338 (M)

**Treasurer**
Dr. Pubudu Chulasiri
Tel: 0718173150 (M)

**Editor**
Prof.S.B.Agampodi
Tel: 777880096 (M)

**Asst. Secretary**
Dr.Dushyanthi Alagiyawanna

**Asst. Treasurer**
Dr. Ishanka Talagala

**Asst. Editor**
Dr.Athula Liyanapathirana

**Ex. Officio**
Dr. S.M Arnold
Dr. Manuja Perera

**Council**
Dr.Rowan Ferdinando
Dr. R Kesavan
Dr.Sharmi Madawage
Dr.Nimal Gamagedara
Dr.Rohan Rathnayake
Dr.T.M.E.Dabrera
Dr.C.M.Wikramaarachchi
Dr.C.D Gunaratne
Dr.P.M.R.B Indika Pathiraja
Dr.Murali Vallipuranathan
Prof.Manuj Weerasinghe
Dr.Saveen Semage
Dr.P.H.S Fernando
Dr.Hasitha Aravinda Tissera
Dr.A.W.I.P Ranasinghe

## එන්නත් ලබාදීම දේශපාලනීයකරණය කිරීම : COVID-19 එන්නත් වැඩ සටහන

COVID 19 ආසාදනය මැඩලීම සඳහා එන්නත් ලබා දීම මානව ඉතිහාසයේ වැඩිවශයෙන් කථා බහට ලක්වුණු, දියුණු සහ වේගවත්මවූ (ඉක්මණින් ප්‍රතිලාභීන් වෙත ළඟාවූ) එන්නත් වැඩ සටහනයි. ලොව ආදායම් බෙදීයාමේ විෂමතාව සහ එන්නත් මාෆියාවක් ඇතිවීමේ හැකියාව කල් තබා හඳුනාගත් ජාත්‍යන්තර විශේෂඥයින් COVAX වැඩ පිළිවෙළ හඳුන්වා දුන් අතර එහි මූලික අරමුණ වූයේ සෑම රටකටම ඔවුන්ගේ ආදායම් තත්වය නොසලකා, සමාන ලෙස සහ විද්‍යාත්මක ලෙස එන්නත් ලැබීමට සැලැස්වීමයි.

එනමුත්, අසමාන ලෙස ගෝලීයව එන්නත් බෙදීයාම වැළැක්විය නොහැකිවූ අතර එය දැනටමත් බරපතල විෂමතාවයක් පෙන්නුම් කරයි. වැඩි ආදායම් ලබන රටවල් අඩු ආදායම් ලබන රටවල් වලට සාපේක්ෂව 80 ගුණයකින් වැඩියෙන් තම ජනගහනයන්ට එන්නත් ලබා දී ඇත.

පසුගිය ජනවාරි මාසයේ අග සිට ශ්‍රී ලංකාවට එන්නත් වර්ග තුනක් (ඇස්ට්‍රාසෙනෙකා, ස්පුට්නික්, සිනොෆාර්ම්) ලැබුණු අතර එයින් වැඩි ප්‍රමාණයක් පරිත්‍යාග වශයෙන් ලැබුණු අතර මිලදී ගැනීමට හැකි වූයේ ඇස්ට්‍රාසෙනෙකා කොවිෂීල්ඩ් එන්නත් මාත්‍රා 500,000 ක් පමණි. පළමු වටය ලබා දීමෙන් පසු සැලකෙන කාලයක් එන්නත් ලබා ගැනීමට අපහසුවූ අතර අප මෙතෙක් එක් මාත්‍රාවක් හෝ එන්නත් ලබා දී ඇත්තේ ඉලක්කගත ජනගහනයෙන් ආසන්න වශයෙන් 8% කට පමණි.

CVODI-19 වැළැක්වීම, පිළිබඳව තීන්දු තීරණ ගැනීම, අප හාවිමත් සිදු කරනු ලබමින් සිටින්නේ ජාතික මට්ටමිනි. සම්පත් වෙන් කිරීම, රෝගීන් සඳහා රෝහල් වෙන් කිරීම, ඇඳන් වෙන් කිරීම, එන්නත් බෙදා හැරීම යනාදිය අපි භාවිමත් තීරණය කරනු ලබන්නේ මධ්‍යගතව ය. තීන්දු තීරණ ගැනීම විවිධ අය විසින් කරනු ලැබීම සහ එහි මනා සම්බන්ධීකරණයක් නොමැතිවීම නිසා එම පසුබිම ශ්‍රී ලංකාවේ COVID 19 පාලනයට බොහෝ හැටළු මතුකර ඇත

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිශක්තිකරණ ව්‍යාපාරය ලොව ඉතාමත් සාර්ථක ප්‍රතිශක්තිකරණ වැඩ සටහනක් ලෙස සැලකෙන අතර එය ඉහළ ප්‍රතිශක්තිකරණ ආවරණ අගයන් ලබා ගැනීමෙන් සහ පෝලියෝ සරම්ප වැනි රෝග තුරන් කිරීමේ ගෝලීය වැඩ සටහන් වලදී ඉදිරියෙන්ම සිටී. එන්නත් ලබා දීම පිළිබඳව වගකීම දරණ වසංගත රෝග විද්‍යා අංශය, වඩාත් ආරක්ෂිත සහ ගුණාත්මක එන්නත් මිලදී ගැනීමේදී සහ එන්නත් මගින් වළක්වන රෝග පිළිබඳ ආවේක්ෂණය සහ අතුරු ආබාධ පිළිබඳ ආවේක්ෂණයේදී ලොව ඉහළම තාක්ෂණික හැකියාවක් තිබෙන ආයතනයක් ලෙස ප්‍රසිද්ධියක් ලබා තිබිණි. ශ්‍රී ලංකාවේ එන්නත් ලබා දීම පිළිබඳ ඉතිහාසය 19 වන සියවස දක්වා දිව යයි.

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන විමධ්‍යගත කර ඇති අතර එය දිස්ත්‍රික් හා බිම් මට්ටමේ දී, දිවයින පුරා පුළුල් ජාලයක් ලෙස විසිරී ඇති මහජන සෞඛ්‍ය සේවාවලට පූර්ණ ලෙස ඒකාබද්ධ වී ඇත. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ වල සේවය කරන මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, මහජන සෞඛ්‍ය හෙද සොයුරිය, පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක, මහජන සෞඛ්‍ය පරීක්ෂක, පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණි , පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණි) එන්නත් ලබා දීම සඳහා පුහුණු කරණු ලැබූ තාක්ෂණික නිලධාරීන්ගෙන් ගෙන් සමන්විත වේ.

COVID-19 ට එරෙහිව එන්නත් ලබා දීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී එයට නියමිත වේලාවට එන්නත් ලබා ගැනීම, මූල්‍ය සම්පත් වෙන් කිරීම, මානව සම්පත් පුහුණු කිරීම, එන්නත් බෙදා හැරීම, සැලසුම් කිරීම සහ, විධාත්ම වැදගත් කරුණු ලෙස ප්‍රමුඛතාවය දිය යුත්තේ කාටද යන්න පිළිබඳව පැහැදිලි සැලැස්මක් තිබිය යුතුව තිබුණි. මෙය ප්‍රමාණවත් මූලික සැලසුමක් සහිතව අවදානම පිළිබඳ හොඳ සන්නිවේදනයක් සහ දැනට කරගෙන යනු ලබන අනෙකුත් කටයුතු වලට බාධාවක් නොවිනතයේ කාර්ය මණ්ඩල සූදානම් කිරීමක් සමඟ අත්වැල් බැඳ ගත යුතුව තිබිණි.

ඉහත කිසිවක් හෝ පිළිපැදීමට අපොහොසත් වීමත් තීන්දු තීරණ අවිධිමත් ලෙස ගැනීමත් එන්නත් වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලි ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබීමත් නිසා එන්නත් වැඩ සටහන මේ වන විට අවුල් ජාලයක් වී ඇත. එක් එක් අයගේ පෞද්ගලික අවශ්‍යතා ඉටු කිරීමට යාමත් විවිධ අයගේ අදහස් වලට එකග වීමත් නිසා ශ්‍රී ලංකාවේ වර්තමාන COVID 19 එන්නත් කිරීමේ වැඩ සටහන විසින් ඇති කර ඇති ගැටළු, කෙටි කාලීන සහ දිගු කාලීන ලෙස අහිතකර ප්‍රතිඵල ගණනාවකට මගපාදනු ඇත.

අපි මේ තාක් පැවති මෙම COVID 19 එන්නත් වැඩ සටහනෙහි ප්‍රධාන ගැටළු ලෙස පහත කරුණු හඳුනා ගෙන ඇත්තෙමු.

1. පැහැදිලි ඉදිරි සැලැස්මක් නොමැතිකම

2. පවතින සීමිත එන්නත් ප්‍රමාණය සංකූලතා සහ මරණ අවම කිරීමේ අරමුණින්
   ප්‍රමුඛතාවය දීමට කිසිදු උත්සාහයක් නොගැනීම

3. දුර්වල සැලසුම්කරණය හේතුවෙන් ඉල්ලුම හා සැපයුම් නොගැලපීම (මූල්‍යමය හා
   මානව සම්පත් යන දෙඅංශයෙන්ම)

3. එන්නත් කිරීමේ ව්‍යාපාරයට බාධා කරන වන පරිදි අනවශ්‍ය පාර්ශ්වකරුවන්
   මිනෑවිට වැඩ සම්බන්ධ කර ගැනීම

4. අවදානම් සන්නිවේදනය ප්‍රමාණවත් නොවීම

5. සෑම මට්ටමකමදීම ඇති කර ඇති අවිනිශ්චිතතාව (පුද්ගල, සංවිධාන සහ
   දේශපාලන)

ඉහත ගැටළු නිසාම එන්නත් ලබාදීමේදී විවිධ සිදුවීම් වාර්තා වී තිබේ. (මුදලට විකිණීම, නුසුදුස්සන්ට ලබාදීම) මේ හැර ඇස්ට්‍රාසෙනෙකා පළමු මාත්‍රාව ලබාගත් ලක්ෂ 6 කට ආසන්න ජනතාවට තම දෙවන එන්නත ලබා ගැනීම පිළිබඳව අවිනිශ්චිතතාවයකට මුහුණ දීමට සිදුව තිබේ. ඊට අමතරව දේශපාලකයින් සහ නොයෙකුත් මාධ්‍ය මගින් කරන ප්‍රකාශ නිසා මෙතෙක් කලක් සාර්ථකව කරගෙන ආ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩ සටහනද අපකීර්තියට පත්වීමට ඉඩ තිබේ.

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩ සටහනට සෘජුවම දායක වී ඇති, එය මෙහෙයවීම පිළිබඳ තාක්ෂණික දැනුම ඇති, ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍යවරුන්ගේ සංගමයේ සාමාජිකයින් වන අපි, COVID 19 එන්නත්කරන වැඩසටහනට අදාළව ඇතිවී තිබෙන මෙම තත්වය පිළිබඳව අපේ බලවත් කණස්සල්ල ප්‍රකාශ කර සිටින අතර බාහිර බලපෑම් වලින් තොරව තාක්ෂණික දැනුම ඇති නිලධාරීන්ට මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිසරය සකස් කරන ලෙස අදාල බලධාරීන්ගෙන් දැඩි ඕනෑකමින් ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍යවරුන්ගේ සංගමය
22.05.2021

# සමාජ වගකීම

මිනිසුන් භීතියටත් ශෝකයටත් ,පත්කරමින්, ඣඩඵෂෘ-19, වසංගතය, (කොරෝනා වෛරසය) මේවන විට, ලොව පුරා පැතිරෙමින්, ජීවිත ලක්‍ෂ ගණනින් බිලිගනිමින් පවතී. කොරෝනා වෛරසය පැතිරීමේ ප්‍රතිඵලයක් ලෙෂ, මේවන විට, සමාජ ආර්ථික දේශපාලනික වශයෙන් මෙන්ම සංස්කෘතිකමය වශයෙන් විශාල ලෙෂ අයහපත් ආකාරයේ වෙනස්කම් සිදුවීමේ ප්‍රවණතාවයක් දකින්නට ඇත.

එසේම මෙය ලෝක ආර්ථිකයට තදබල පහරක් එල්ලකර ඇත. මෙමගින් මහා පරිමාණ ව්‍යාපාරික ලෝකයට සිදුවූ බලපෑමත් සමඟ, කර්මාන්ත ක්ෂෙත්‍රය තුල ඇතිවූ ඇනහිටීම, විශාල වශයෙන් කම්කරුවන් ලෙෂ වැඩ කරන ප්‍රජාවට තදබල බලපෑමක් එල්ල කෙරිණි. මෙය බොහෝ රටවලට මෙන්ම අපේ රටට ද පොදු වූ තත්වයකි. ලොව පුරා මෙම ආර්ථික අර්බුදය හේතුවෙන් රැකියා අහිමි වන්නන්ගේ සංඛ්‍යාව දිනෙන් දින වැඩිවීම, ජීවන මාර්ග අහිමි වීම වැනි තත්වයන් පොදු ලක්‍ෂණ අතර වේ. නමුත් මෙම ආර්ථික පරිහාණියේ බරපතලකම ලොව ප්‍රබලම රටවලට දැනෙන ප්‍රමාණයට වඩා, ආසියානු කළාපයට අයත් ලංකාව වැනි දුප්පත් නැතහොත් සංවර්ධනය වන රටවල්,වලට සිදුවන බලපෑම වැඩිවන්නේ, ධනපති ව්‍යාපාරිකයින් විසින් හසුරුවන, වෙළඳපොළ මත යැපෙන, සහ සේවා ආරථිකයක් මත මෙහෙයවන ස්වාධීන නොවන, ගැති ආර්ථික ක්‍රියාවලියක කොටස්කරුවන් නිසාය.

වර්තමාන ලෝකයේ ආර්ථික අර්බුදය පිළිබඳව විචාරකයෙකු ලෙෂ සහ විද්වතෙක ු ලෙෂ හඳුන්වන ඊ.එෆ්. ෂූමාකර් ඉදිරිපත් කරන අදහස්, අදට බොහෝ සෙයින් අදාළ වේ. ඔහුගේ විග්‍රහය අනුව ලොව දනට නිර්මාණය වී ඇති ප්‍රශ්න භෞතිකවාදී ආර්ථික දර්ශනයකින් විසඳිය හැකි නොවේ. එපමණක් ද නොව ඒවා අනුගමනය කිරීමෙන් අහිතකර ප්‍රතිඵල රාශියක් ද නිර්මාණය වෙයි.

භෞතිකවාදය පදනම් කරගත් ආර්ථික න්‍යායන් අනුගමනය කිරිම නිසා, වර්තමානයේ දී මිනිසා ස්වකීය විද්‍යාත්මක හා තාක්ෂණික බල මහිමයන් හෙළිදරව් කිරමේ උඩගුවෙන්, ස්වභාව ධර්මය බලහත්කාරයෙන් දූෂණය කරවන්නා වූ නිෂ්පාදන රටාවක් ද, මනුෂ්‍යාත්මය කෙසෙසන්නා වූ සමාජ ක්‍රමයක් ද ගොඩනගාගෙන ඇතැයි පෙන්වා දෙන ෂූමාකර්, ලොව අන් සියලු දේට වඩා මුදල් බලවත් යැයි සලකන මුළාවට වැටී ඇතැයිද පවසයි. ඒ නිසාම නිෂ්පාදනය වැඩිකර ගැනීමත්, වඩ වඩා ධනය එක් රැස් කර ගැනීමත් නූතන ලෝකයේ ප්‍රධාන අරමුණු බවට පත් වී ඇති අතර. යුක්තිය. සාමය සෞඛ්‍ය ආදී ද්‍රව්‍යමය නොවූ දේවල් මුදලට ගත නොහැකි බව නොසලකා හැරීමෙන්, අවාසනාවන්ත ලෙස ඊට වන්දි ගෙවන්නට ද සිදු වී ඇතැයි ද සාදක සහිත ව සනාථ කරයි. මේ අසාර්ථක හා අනර්ථකාරි න්‍යයයන් වෙනුවට, මනුෂ්‍යත්වයට මුල් තැනක් ලැබෙන, මිනිසාට සැබැවින් ම තෘප්තිය ලඟා කරගතහැකි ආර්ථික දර්ශනයක අත්‍යවශ්‍යතාවය ද ඔහු අවධාරණය කර තිබේ. ඔහුගේ අදහස වන්නේ, වැඩ පිළිබඳ බෞද්ධ ආකල්පය, අහිංසා සංකල්පය ස්වභාව ධර්මයට හිතවාදී පැවැත්ම යන කරුණුවලට මුල් තැනක් ලැබෙන ආර්ථික ක්‍රමයක් මගින් වර්තමාන ලෝකය යොමු වී ඇති විනාශකාරී අගාධයෙන් මුදාගත හැකි බව ය.

අද වන විට රටේ ස්ත්‍රීන් ඇතුළු බහුතර පිරිසක්. නිශ්පාදන ක්‍රියාවලියක කොටස්කරුවන් ලෙෂ නොව වැටුපකට වැඩකරන සේවකයින් ලෙෂ අභිමානයක් නැති පිරිසක් බවට පත්ව ඇත. එසේ ලබන අදායම, තම පවුල් ජීවත් කරවීමට,තම දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බැවින්, ණය නොවී ලැබෙන මුදල කළමණාකරණය කරගැනීමට නොහැක. මේ නිසාම මේ ජීවිතවලට බොහෝ කැපකිරීම් කිරීමට සිදුව ඇත. නිදහස, විනෝදය, පවුලේ සාමාජික සාමාජිකාවන් සමග ගතකිරීමට හා පොතපත කියවීමට ඇති කාලය ඒ සඳහා කැපකරයි. නිසි පෝෂණ ගුණයෙන් යුතු ආහාර වේලක් ගැනීමට පවා හැකියාවක් නැත, අවිවේකය, රක්තහීනතාවය හා මන්දපෝෂණයෙන් මෙන්ම ඉතා දරුණු ලෙඩරෝග වලටද ගොදුරුවීමේ ප්‍රවනතාවය වැඩිවී ඇත. කොරෝනා වෛරසය කඩඊෂෘ-19, ව්‍යාප්තිය සමඟ මේ තත්වය තවදුරටත් දරුණු ලෙෂ උග්‍ර විය.

ජීවන මාර්ග නැවතීම, ගොවින්ට තම නිශ්පාදන අලෙවි කර ගැනීමට නොහැකි වීම,ධීවර ප්‍රජාවට කර්මාන්තය කර ගැනීමට නොහැකි වීම, මත්ස්‍ය වෙළඳපොළට බාධාවක් වීම,තුළ ධීවර පවුල්වලට ආදායම අහිමිවීම, වැවිලි ක්ෂේත්‍රයතුළ කම්කරු ප්‍රජාවට,රැකියාවේ අස්ථාවර බව වැඩිවීම, ඇඟළුම් ක්ෂේත්‍රය කම්කරුකාන්තාවන්ට,රැකියාව අහිමිවීම සහ රැකියාවේ අස්ථාවර බව වැඩිවීම, සෞඛ්‍යය ආරක්ෂිත වැඩපිළිවෙල වල් වල විධිමත්බවක් නොමැති වීම. අනාරක්ෂිත සෞඛ්‍යය තත්වය නිසා අවධානම් තත්වය වැඩිවීම. මැදපෙරදිග ගෘහසේවිකාවන් මෙරටට ගෙන්වාගැනීම සහ ඔවුන්ගේ සෞඛ්‍යය ආරක්ෂාව පිළිබඳව වගකිවයුතු රජය මැදිහත් නොවීම නිසා එම කාන්තාවන්ට පීඩාකාරී තත්වයන්ට මුහුණ දීම සහ ජීවිතවලින් වන්දිගෙවීමට පවා සිදුවීම. අධික මිල ගණන්වලට පාරිභෝගික ද්‍රව්‍ය මිලට ගැනීමට සිදුවීම.සුළු වෙලදාමෙහි යෙදෙන්නන්,දෛනික කුලීකරුවන්,ආර්ථික දරිද්‍රතාවයට මුහුණ දීම. පාසැල් දරුවනගේ මාර්ගගත අධ්‍යාපනය සඳහා විශාල අමතර මුදලක් වැය කිරීමට දෙමව්පියන්ට සිදුවීම, ක්ෂුද්‍ර මූල්‍ය ණයබරින් පීඩාවට පත් කාන්තාවන්ට, තවදුරටත් සහනයක් නොලැබීම. සහනාධාර වැඩපිළිවෙලවල් ක්‍රමවත් නොවීම සහ ඒවා ද නිලධාරින් සහ දේශපාලකයින් විසින් අක්‍රමකතා සිදුකිරීම,එන්නත් කරන වැඩපිළිවෙල සහ නිරෝදායන ක්‍රියාවලියද, දේශපාලනීකරණය වීම තුළ අත්‍යවශ්‍ය පිරිසට එම අවස්ථා අහිමිවීම වැනි දහසක් ප්‍රශ්ණ වලින් මිරිකෙන රටේ සාමාන්‍ය ජනතාව කඩඊෂෘ-19 වසංගතය නිසා සිදුවූයේ කබලෙන් ලිපට වැටීමකි.

අධ්‍යාපන, සෞඛ්‍යය, ප්‍රවාහන, එලෙස ලාභ ඉපයීමේ ජාවාරම් බවට යොමුකල, ක්ෂේත්‍ර අතර ප්‍රධාන වේ. මෙම ව්‍යසන අවස්ථාවේද ජාතිය සහ ආගම දේශපාලන වාසිතකා පාවිච්චි කළ අවස්ථාවලද අඩුවක් නැත. ප්‍රාග්ධනය මත සියල්ල තීරණය වන, අදවැනි යුගයක, මිනිස්කම නොතකමින් ආගමික හරයන් තුට්ටුවකට නොසලකමින් ක්‍රියාකිරීම හැම ක්ෂෙත්‍රයකම දකින්නට ලැබෙන පොදු තත්වයකි. රටේ ප්‍රතිපත්තිගරුක දේශපාලනයක් නොමැතිවීම මීට ප්‍රධානම හේතුවයි. මෙම ජරාජීරණය වූ දේශපාලන ක්‍රමය ප්‍රතික්ෂප කරමින් සමාජය යහපත් කිරීමට, ස්ත්‍රීමය දැක්මක් සහිත මැදිහත් වීමක් අද රටේ අවශ්‍යතාවයයි.

